පාර්ලිමේන්තුවේ පුස්තකාලය
1979-2-11

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1979 අංක 7 දරන රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබා ගැනීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1979 ජනවාරි මස 25 වන දින]

ඇණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1979 ජනවාරි මස 26 වැනි/දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

මිළ : ශත 55 යි

තැපැල් ගාස්තුව : ශත 25 යි

# 1979 අංක 7 දරන රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබා ගැනීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1979 ජනවාරි මස 25 වන දින]

එල්. ඩී.—ඕ. 32/78.

**අනවසරයෙන් රජයේ ඉඩම්වල සන්තකය දරන හෝ පදිංචිව සිටින තැනැත්තන්ගෙන් ඒවායේ සන්තකය ආපසු ලබා ගැනීම සඳහා ද, ඒ හා සම්බන්ධ වූ හෝ ඊට ආනුෂංගික වූ කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 1979 අංක 7 දරන රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබා ගැනීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. *(ලුහුඬු නාමය.)*

**2.** (1) මේ පනතෙහි විධිවිධාන සියලු ම රජයේ ඉඩම්වලට අදාළ වන්නේ ය. *(මේ පනත අදාළ වීම.)*

(2) යම් තැනැත්තකු විසින් යම් රජයේ ඉඩමක් සම්බන්ධයෙන් දරනු ලබන සන්තකය හෝ පදිංචිය සියලු ම අවස්ථාවල දී මේ පනතේ විධිවිධානවලට යටත් වූ ලෙස ද යටත් වන ලෙස ද සල කනු ලැබිය යුතු ය.

**3.** (1) යම් තැනැත්තකු අනවසරයෙන් යම් රජයේ ඉඩමක සන්තකය දරන්නේ යයි හෝ පදිංචිව සිටින්නේ යයි නියම බලධරයාගේ මතය වන අවස්ථාවක එහි සන්තකය දරන හෝ පදිංචිව සිටින ඒ තැනැත්තා වෙත දැන්වීමක් නියම බලධරයා විසින් භාර දෙනු ලැබිය හැකි ය. නැතහොත් එසේ භාර දීම ක්‍රියාත්මක කළ නොහැකි යයි හෝ අවස්ථානුකූල නොවේ යයි නියම බලධරයා සලකන අවස්ථාවක ඒ තැනැත්තාට ඔහුගේ යැපෙන්නන් කිසිවකු වෙතොත් ඔවුන් ද සමග ඒ ඉඩමෙන් ඉවත්ව යන ලෙස හා නියමිත දිනයක හෝ ඊට පෙර ඒ නියම බලධරයා වෙත හෝ දැන්වීමෙහි සඳහන් වෙනත් බලය දෙනු ලැබූ තැනැත්තා වෙත ඒ ඉඩමේ නිරවුල් සන්තකය භාර දෙන ලෙස නියම කරමින් ඒ දැන්වීම එම ඉඩමෙහි හෝ ඉඩම මත ප්‍රකටව පෙනෙන ස්ථානයක ප්‍රදර්ශනය කළ යුතු ය. ඒ දැන්වීමෙහි සඳහන් කරනු ලබන දිනය, ඒ දැන්වීම නිකුත් කරන ලද හෝ ප්‍රදර්ශනය කරන ලද දින සිට දින තිහකට නොඅඩු දිනයක් විය යුතු ය. *(අනවසරයෙන් පදිංචිව සිටින හෝ සන්තකය දරන පාර්ශ්වකරුව ඉඩමෙන් ඉවත් වන ලෙස දැන්වීමක් කළ යුතු බව.)*

(2) යම් රජයේ ඉඩමක් සම්බන්ධයෙන් (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද සෑම දැන්වීමක් ම මේ පනතෙහි "අස්කිරීමේ දැන්වීමක්" යනුවෙන් හඳුන්වනු ලැබේ.

(3) යම් රජයේ ඉඩමක් සම්බන්ධයෙන් වූ අස්කිරීමේ දැන්වීමක් ඒ ඉඩමේ සන්තකය දරන හෝ පදිංචිව සිටින තැනැත්තා වෙත ඒ දැන්වීම ලියාපදිංචි තැපැලෙන් යවනු ලැබුවහොත් ඒ දැන්වීම ඒ තැනැත්තා වෙත භාර දෙනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) සෑම අස්කිරීමේ දැන්වීමක් ම මේ පනතෙහි උපලේඛනයෙහි දක්වා ඇති 'අ' ආකෘතියෙහි විය යුතු ය.

2—ඒ 38026–13,300 (78/11)

අස්කිරීමේ දැන්වීමක් අනුව ක්‍රියා කිරීමට බැඳී සිටින බව.

4. 3 වන වගන්තිය යටතේ අස්කිරීමේ දැන්වීමක් භාර දෙනු ලැබ ඇති හෝ ප්‍රදර්ශනය කරනු ලැබ ඇති අවස්ථාවක—

(අ) ඒ දැන්වීම අදාළ වන ඉඩමේ සන්තකය දරන හෝ පදිංචිව සිටින තැනැත්තා හෝ ඒ තැනැත්තාගේ යැපෙන්නන් අතුරින් යම් යැපෙන්නකු හෝ ඒ දැන්වීමෙහි සඳහන් දිනයට පසුව ඒ ඉඩමෙහි සන්තකය දැරීමට හෝ එහි පදිංචිව සිටීමට හෝ 9 වන වගන්තියෙන් විධිවිධාන සලස්වා ඇති ආකාරයෙන් හැර කවර වූ හෝ යම් හේතුවක් මත ඒ දැන්වීමට විරෝධය පෑමට හෝ හිමිකම් නොලබන්නේ ය.

(ආ) සන්තකය දරන හෝ පදිංචිව සිටින තැනැත්තා, ඔහුගේ යැපෙන්නන් කිසිවකු වෙතොත් ඔවුන් ද සමග, ඒ ඉඩමෙන් යථා පරිදි ඉවත් විය යුතු අතර නියම බලධරයාට හෝ ඒ දැන්වීම මගින් නිරවුල් සන්තකය භාර දීමට නියම කරන ලද්දේ යම් තැනැත්තකු වෙත ද, ඒ තැනැත්තා වෙත එහි නිරවුල් සන්තකය භාර දිය යුතු ය.

අස්නොකිරීමේ දැන්වීමක් අනුව ක්‍රියා නොකිරීමේ ප්‍රතිඵලය.

5. (1) අනවසරයෙන් යම් රජයේ ඉඩමක සන්තකය දරන හෝ පදිංචිව සිටින යම් තැනැත්තකු මේ පනත යටතේ නිකුත් කරන ලද හෝ ප්‍රදර්ශනය කරන ලද නැතහොත් නිකුත් කරනු ලැබුවේ යයි හෝ ප්‍රදර්ශනය කරනු ලැබුවේ යයි කියනු ලබන යම් අස්කිරීමේ දැන්වීමක් සම්බන්ධයෙන් 4 (ආ) වන වගන්තියේ විධිවිධාන අනුව ක්‍රියා කිරීම පැහැර හරින අවස්ථාවක, ඕනෑම නියම බලධරයකු විසින් (ඒ දැන්වීම නිකුත් කරන ලද හෝ ප්‍රදර්ශනය කරන ලද හෝ නියම බලධරයා ඔහු වුවද නොවුවද)—

(අ) පහත සඳහන් කරුණු දක්වමින්, එනම්—

(i) මේ පනතේ කාර්ය සඳහා තමා නියම බලධරයකු බව,

(ii) ඉල්ලීමේ උපලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම රජයේ ඉඩමක් බව,

(iii) එම ඉඩමේ සන්තකය දරන හෝ පදිංචිව සිටින තැනැත්තා වෙත අස්කිරීමේ දැන්වීමක් නිකුත් කරන ලද බව හෝ එම දැන්වීම ඒ ඉඩමෙහි හෝ ඉඩම මත ප්‍රකටව පෙනෙන ස්ථානයක ප්‍රදර්ශනය කරන ලද බව,

(iv) ඉල්ලීමේ නම් කර ඇති ඒ තැනැත්තා අනවසරයෙන් ඒ ඉඩමේ සන්තකය දරන හෝ පදිංචිව සිටින බව හෝ ඒ ඉඩමට අදාළ වූ එම දැන්වීම සම්බන්ධයෙන් ඉහත කී 4 වන වගන්තියේ (ආ) ඡේදයේ විධිවිධාන අනුව ක්‍රියා කිරීම පැහැර හැර ඇති බව, සහ

(ආ) ඒ ඉඩමේ සන්තකය ආපසු ලබා ගැනීම සඳහා හා සන්තකය දරන හෝ පදිංචිව සිටින ඒ තැනැත්තා සහ ඔහුගේ යැපෙන්නන් කිසිවකු වෙතොත් ඔවුන් ද ඒ ඉඩමෙන් නෙරපීමේ ආඥාවක් සඳහා අයැදිමින්,

ඒ ඉඩම හෝ එහි යම් කොටසක් හෝ පිහිටා ඇති ප්‍රදේශය විෂයෙහි අධිකරණ බලය දරන මහෙස්ත්‍රාත් අධිකරණය වෙත මේ පනතේ උපලේඛනයේ දක්වා ඇති 'ආ' ආකෘතියෙහි වූ ලිඛිත ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ එවැනි සෑම ඉල්ලීමක් ම මේ පනතේ උපලේඛනයෙහි දක්වා ඇති 'ඇ' ආකෘතියෙහි වූ ද, එම ඉල්ලීමෙහි දක්වා ඇති කරුණු තහවුරු කරන්නාවූ ද, දිවුරුම් පත්‍රයකින් සනාථ කළ යුතු අතර, අස්කිරීමේ දැන්වීමේ පිටපතක් ද ඒ සමග ඉදිරිපත් කළ යුතු ය.

(3) මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ දිවුරුම් පත්‍රයකින් සනාථ කරනු ලැබ අස්කිරීමේ දැන්වීමේ පිටපතක් සමග ඉදිරිපත් කරන ලද සෑම ඉල්ලීමක් ම "නෙරපීම සඳහා වූ ඉල්ලීමක්" යනුවෙන් සඳහන් කරනු ලැබිය යුතු ය.

(4) නෙරපීම සඳහා වූ යම් ඉල්ලීමක් වෙනුවෙන් කිසිම මුද්දර ගාස්තු ගෙවීමක් නොවිය යුතු ය.

ඉල්ලීමෙහි නම් කර ඇති තැනැත්තාට හේතු දක්වන ලෙස මහෙස්ත්‍රාත්වරයා විසින් දැන්වීමක් නිකුත් කළ යුතු බව.

6. (1) 5 වන වගන්තිය යටතේ කරන ලද ඉල්ලීම ලැබුණු විට ඒ ඉල්ලීමෙහි නම් කර ඇති තැනැත්තා සහ ඔහුගේ යැපෙන්නන් කිසිවකු වෙතොත්, ඔවුන් ද නෙරපීම සඳහා වූ ඉල්ලීමෙන් අයැද ඇති පරිදි ඒ තැනැත්තා හා ඔහුගේ යැපෙන්නන් කිසිවකු වෙතොත් ඔවුන් ද ඉඩමෙන් නෙරපීම නොකළ යුත්තේ මන්දැයි සිතාසියේ සඳහන් (ඒ සිතාසිය නිකුත් කරන ලද දිනයෙහි සිට සති දෙකක් ඉකුත් වීමට පෙර දිනයක් විය යුතු) දිනයෙහි පැමිණ හේතු දක්වන ලෙස මහෙස්ත්‍රාත්වරයා විසින් වහාම ඒ ඉල්ලීමේ නම් කර ඇති තැනැත්තා වෙත සිතාසි නිකුත් කළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් සිතාසි නිකුත් කිරීම හා එය භාරදීම සහ කැඳවනු ලැබූ තැනැත්තා පැමිණ පෙනී සිටීම සඳහා අවශ්‍ය වෙනත් පියවර සම්බන්ධයෙන් ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 44 දරන යුක්තිය පසිඳලීමේ පනතේ II වන පරිච්ඡේදයෙහි ඇතුළත් විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ වන්නේ ය.

හේතුවක් දක්වා නැති අවස්ථාවක නෙරපීම සඳහා ආඥාව.

7. 6 වන වගන්තිය යටතේ සිතාසි නිකුත් කරන ලද්දේ යම් තැනැත්තකු වෙත ද ඒ තැනැත්තා ඒ සිතාසියෙහි දක්වා ඇති දිනයෙහි පෙනී සිටීම පැහැර හරින්නේ නම් හෝ නෙරපීම සඳහා වූ ආඥාවට විරුද්ධව දැක්වීමට හේතුවක් නොමැති බව අධිකරණයට දන්වන්නේ නම් ඒ තැනැත්තා සහ ඔහුගේ යැපෙන්නන් කිසිවකු වෙතොත් ඔවුන් ද, එම ඉඩමෙන් වහාම නෙරපීමට විධාන කරමින් ආඥාවක් අධිකරණය විසින් වහාම නිකුත් කළ යුතු ය.

හේතු දක්වන්නේ නම් විභාගය.

8. (1) 6 වන වගන්තිය යටතේ සිතාසි භාර දෙන ලද්දේ යම් තැනැත්තකු වෙත ද ඒ තැනැත්තා ඒ සිතාසියෙහි දක්වා ඇති දිනයෙහි පෙනී සිට නෙරපීම සඳහා ආඥාවක් නිකුත් කිරීමට විරුද්ධව තමාට හේතු දක්වීමට ඇති බව ප්‍රකාශ කරන්නේ නම් මහෙස්ත්‍රාත් අධිකරණය විසින් වහාම එම කරුණ විභාග කොට නිශ්චය කිරීමට වහාම ක්‍රියා කරනු ලැබිය හැකි ය. නැතහොත් නඩුව පසු දිනයක දී විභාග කිරීම සඳහා තැබිය හැකි ය.

(2) නෙරපීම සඳහා යම් ඉල්ලීමක් මහෙස්ත්‍රාත් අධිකරණයක් වෙත ඉදිරිපත් කර තිබෙන අවස්ථාවක වෙනත් යම් කාරණයක් කලින් විභාග කොට, අවසන් කිරීම අවස්ථානුගත කරුණු අනුව අවශ්‍ය වන විටක හැර, මහෙස්ත්‍රාත්වරයා විසින් ඒ අධිකරණයේ එවැනි වෙනත් සියලු කාරණාවලට වඩා වැඩි ප්‍රමුඛත්වය ඒ ඉල්ලීම විභාග කොට අවසන් කිරීම සම්බන්ධයෙන් දිය යුතු ය.

විභාගයේ විෂය ප්‍රමාණය.

9. (1) 6 වන වගන්තිය යටතේ සිතාසි භාර දෙන ලද්දේ යම් තැනැත්තකු වෙත ද ඒ තැනැත්තා, ඒ විභාගයේ දී වලංගු බලපත්‍රයක් හෝ යම් ලිඛිත නීතියකට අනුකූලව රජය විසින් ප්‍රදානය කරන ලද වෙනත් ලිඛිත අධිකාරයක් මත ඉඩමේ සන්තකය දරන බව හෝ පදිංචිව සිටින බවත් එම බලපත්‍රය හෝ අධිකාරය වලංගුව බලපැවැත්වෙන බවත්, එය ප්‍රත්‍යාදිෂ්ට හෝ අන්‍යාකාරයකින් අවලංගු නොකරන ලද බවත් ඔප්පු කිරීම හැර, 5 වන වගන්තිය යටතේ ඉල්ලීමෙහි ප්‍රකාශ කර ඇති කරුණු අතුරින් යම් කරුණක් සම්බන්ධයෙන් වාද කිරීමට හිමිකම නොලබන්නේ ය.

(2) 5 වන වගන්තිය යටතේ වූ ඉල්ලීම තහවුරු කිරීම සඳහා නියම බලධරයාගෙන් යම් සාක්ෂි කැඳවීමට මහෙස්ත්‍රාත් අධිකරණයට බලය නැත්තේ ය.

නෙරපීමේ ආඥාව.

10. (1) විභාගයෙන් පසුව, හේතු දක්වන තැනැත්තා ඉඩමේ සන්තකය දැරීම හෝ පදිංචිව සිටීම සම්බන්ධයෙන් හිමිකම් ලබන බවට මහෙස්ත්‍රාත්වරයා සෑහීමට පත් නොවන්නේ නම් ඒ ඉඩමෙහි පදිංචිව සිටින ඒ තැනැත්තා හා ඔහුගේ යැපෙන්නන් කිසිවකු වෙතොත් ඔවුන් ද එම ඉඩමෙන් වහාම නෙරපීමට විධාන කරමින් ආඥාවක් ඔහු විසින් කරනු ලැබිය යුතු ය.

(2) මහෙස්ත්‍රාත්වරයකු විසින් (1) වන උපවගන්තිය යටතේ කරන ලද යම් නෙරපීමේ ආඥාවකට විරුද්ධව අභියාචනයක් කළ නොහැකි විය යුතු ය.

නෙරපීමේ ආඥාව ක්‍රියාවෙහි යෙදවීම.

11. (1) යම් තැනැත්තකු 7 වන වගන්තිය හෝ 10 වන වගන්තිය යටතේ කරන ලද ආඥාවක් අනුව ක්‍රියා කිරීම පැහැර හරින අවස්ථාවක මහෙස්ත්‍රාත්වරයා විසින්, නියම බලධරයකුගේ ඉල්ලීම පිට, ආඥාව අදාළ වන්නේ යම් ඉඩමක් සම්බන්ධයෙන් ද ඒ ඉඩමෙන්, ඒ ආඥාවෙන් බැඳෙන සියලුම තැනැත්තන් නෙරපන ලෙස සහ එම ඉඩමේ සන්තකය නියම බලධරයාට හෝ ඔහුගේ නියෝජිතයාට භාර දෙන ලෙස පිස්කල්ට හෝ පොලිස් නිලධරයකුට විධාන කළ යුතු ය.

(2) නෙරපීමේ ආඥාව ක්‍රියාවෙහි යෙදවීම භාර කරන ලද පිස්කල් හෝ පොලිස් නිලධරයා එම ආඥාව කරන ලද මහේස්ත්‍රාත් අධිකරණයේ විධානය අනුව ක්‍රියා කළ යුතු අතර එම ආඥාව තමා ක්‍රියාවෙහි යෙද වූ ආකාරය විධි වූ පරිදි අධිකරණය වෙත වාර්තා කළ යුතු ය.

(3) නෙරපීමේ ආඥාවක් ක්‍රියාවෙහි යෙදවීමේ දී පිස්කල් හෝ පොලිස් නිලධරයා හෝ පිස්කල් හෝ පොලිස් නිලධරයා විසින් බලය දෙනු ලැබූ යම් නිලධරයකු ආඥාව අදාළ වන්නා වූ ඉඩමට ඇතුලුවීමට හා ආඥාවෙන් බැඳී ඇති යම් තැනැත්තකු නෙරපීම සහ ආඥාව නිකුත් කරන ලද මහේස්ත්‍රාත් අධිකරණයේ විධාන අනුව ඉඩමේ සන්තකය භාර දීමට අවශ්‍ය විය හැකි ප්‍රමාණයක බලය පාවිච්චි කරනු ලැබිය හැකි ය.

12. මේ පනතේ විධිවිධාන යටතේ ඉඩමකින් නෙරපන ලද යම් තැනැත්තකු විසින් හෝ එහි අයිතිකරු යයි හිමිකම් පාන යම් තැනැත්තකු විසින් හෝ නෙරපීමේ ආඥාවේ දින සිට මාස හයක් ඇතුළත එම ඉඩමට ඇති ඔහුගේ අයිතිය ඔප්පු කිරීම සඳහා රජයට විරුද්ධව නඩුවක් පවරනු ලැබීම මේ පනතේ ඇතුළත් කිසිවකින් වළක්වනු නොලැබිය යුතු ය. *අයිතිය ඔප්පු කිරීමේ නඩු රජයට විරුද්ධව පවත්වා ගෙන යා හැකි බව.*

13. මේ පනත යටතේ යම් ඉඩමකින් නෙරපනු ලැබුයේ යම් තැනැත්තකු ද ඒ තැනැත්තා විසින් එම ඉඩමට ඇති තම අයිතිය ඔප්පු කිරීම සඳහා රජයට විරුද්ධව 12 වන වගන්තිය යටතේ පවරනු ලැබූ යම් නඩුවක් ඒ තැනැත්තාගේ වාසියට තීරණය කරනු ලැබූ අවස්ථාවක, ඒ ඉඩමේ සන්තකය භාරදීමට තමාට බල කිරීමේ හේතුවෙන් දරන්නට සිදු වූ අලාභය වෙනුවෙන් යුක්ති සහගත වන්දියක් අයකර ගැනීමට ඔහු හිමිකම් ලබන්නේ ය. *වන්දි.*

14. මේ පනත යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී, කාර්යයන් ඉටු කිරීමේ දී සහ කර්තව්‍යයන් කිරීමේ දී නියම බලධරයකු රජයේ ඉඩම් පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයාගේ විධානයට සහ පාලනයට යටත් විය යුතු ය. *නියම බලධරයා විධානයන්ට සහ පාලනයට යටත් බව.*

15. යම් රජයේ නිලධරයකු විසින් මේ පනත යටතේ සද්භාවයෙන් කරන ලද හෝ මේ පනත යටතේ සද්භාවයෙන් කරන ලදැයි සැලකෙන යම් දෙයක් සම්බන්ධයෙන් ඒ නිලධරයාට විරුද්ධව කිසිම සිවිල් නඩුවක් පැවරිය නොහැක්කේ ය. *රජයේ නිලධරයන් ආරක්ෂා කිරීම.*

16. 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනතේ විධිවිධාන මේ පනත යටතේ නඩු කටයුතු සම්බන්ධයෙන් අදාළ නොවන්නේ ය. *සමගි මණ්ඩල පනතේ විධිවිධාන අදාළ නොවන බව.*

17. වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන්ව ඇත ද මේ පනතේ විධිවිධාන බලපැවැත්විය යුතු අතර, ඒ අනුව, මේ පනතේ විධිවිධාන හා වෙනත් නීතියක විධිවිධාන හා අතර යම් ගැටීමක් හෝ නොගැලපීමක් හෝ ඇති වූ විට මේ පනතේ විධිවිධාන බලපවත්වන්නේ ය: *මේ පනත වෙනත් නීති අභිබවා බලපවත්වන බව.*

එසේ වුව ද යම් රජයේ ඉඩමක සන්තකය ආපසු ලබා ගැනීම සඳහා හෝ එයට ඇති අයිතිය තහවුරු කිරීම සඳහා හෝ එවැනි යම් ඉඩමක් පිළිබඳ යම් සහනයක් ඉල්ලා සිටීම සඳහා හෝ වෙනත් යම් නිර්යුක්ත විධිවිධාන යටතේ කටයුතු කර ගෙන යාමට රජයට ඇති අයිතිවාසිකම් කෙරෙහි මේ පනත හානිකර නොවන්නේ ය.

අර්ථ නිරූපණය.

18. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුව හොත් මිස මේ පනතෙහි—

"නියම බලධරයා" යන්නෙන්, එය ඉඩමක් සම්බන්ධයෙන් යෙදෙන විට, ඉඩම පිහිටි දිස්ත්‍රික්කයේ දිසාපතිවරයකු, අතිරේක දිසාපතිවරයකු හෝ සහකාර දිසාපතිවරයකු අදහස් වන අතර—

(අ) ඒ ඉඩම දුම්රිය දෙපාර්තමේන්තුවේ පාලනය යටතේ පවත්නා අවස්ථාවක, දුම්රිය සාමාන්‍යාධිකාරීවරයා ද;

(ආ) ඒ ඉඩම ජාතික නිවාස දෙපාර්තමේන්තුවේ පාලනය යටතේ පවත්නා අවස්ථාවක, ජාතික නිවාස කොමසාරිස්වරයා ද;

(ඇ) ඒ ඉඩම පළාත් පාලන ආයතනයක පාලනය යටතේ පවත්නා අවස්ථාවක, පළාත් පාලන කොමසාරිස්වරයා ද;

(ඈ) මේ පනතේ යම් කරුණක් හෝ විධිවිධානයක් සම්බන්ධයෙන්, දිසාපතිවරයා විසින් බලය දෙනු ලැබූ වෙනත් යම් රාජ්‍ය නිලධරයෙක් ද

එයට ඇතුළත් වෙති;

"යැපෙන්නා" යන්නෙන්, එය රජයේ ඉඩමක සන්තකය දරන හෝ පදිංචිව සිටින තැනැත්තකු සම්බන්ධයෙන් යෙදෙන විට, කලත්‍රයා හෝ දරුවකු හෝ වශයෙන් හෝ අන්‍යාකාරයකින්, සන්තකය දරන හෝ පදිංචිව සිටින තැනැත්තාගෙන් යැපෙන යම් තැනැත්තකු අදහස් වන අතර, සන්තකය දරන හෝ පදිංචිව සිටින තැනැත්තා විසින් එම ඉඩම දැරීමට හෝ එහි පදිංචි වීමට අවසර දෙන ලද වෙනත් යම් තැනැත්තෙක් ද එයට ඇතුළත් වේ;

"පළාත් පාලන ආයතනය" යන්නෙන්, යම් මහ නගර සභාවක්, නගර සභාවක්, සුළු නගර සභාවක් හෝ ගම් සභාවක් අදහස් වන අතර, ඒ යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරන හා ඉටු කරන බලතලවලට, කාර්යවලට සහ කර්තව්‍යවලට අනුරූප වන්නා වූ හෝ සමාන වන්නා වූ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සඳහා යම් කිසි නීතියකින් හෝ නීතියක් යටතේ ඇති කොට, පිහිටුවන ලද කවර වූ හෝ අධිකාරයක් ඊට ඇතුළත් වේ;

"මහවැලි සංවර්ධන මණ්ඩලය" යන්නෙන්, 1970 අංක 14 දරන මහවැලි සංවර්ධන මණ්ඩල පනත යටතේ පිහිටුවන ලද මහවැලි සංවර්ධන මණ්ඩලය අදහස් වේ;

"පොලිස් නිලධරයා" යන්නෙන්, නීතියෙන් පිහිටුවන ලද පොලිස් හමුදාවේ සාමාජිකයකු අදහස් වන අතර පොලිස් කාර්යයන් ඉටු කිරීම සඳහා දිසාපතිවරයා විසින් ලියවිල්ලකින් බලය පවරන ලද යම් ග්‍රාම සේවා නිලධාරියෙක් ද එයට ඇතුළත් වේ;

"ගංගා නිම්න සංවර්ධන මණ්ඩලය" යන්නෙන්, ගංගා නිම්න සංවර්ධන මණ්ඩල පනත යටතේ පිහිටුවන ලද ගංගා නිම්න සංවර්ධන මණ්ඩලය අදහස් වේ; තව ද

"රජයේ ඉඩම්" යන්නෙන් නීත්‍යනුකූලව රජයට හිමිකම ඇත්තා වූ හෝ සහබද්ද හෝ අනුබද්ධ සියලු අයිතිවාසිකම්, සම්බන්ධතා සහ වරප්‍රසාද සමග රජය විසින් බැහැර කරනු ලැබිය හැක්කා වූ හෝ ඉඩම් මත පිහිටි යම් ගොඩනැගිල්ලක් සමග ඒ ඉඩම් අදහස් වන අතර, ගංගා නිම්න සංවර්ධන මණ්ඩලය සහ මහවැලි සංවර්ධන මණ්ඩලය හෝ රජයේ ඉඩම් සංවර්ධනය කිරීමේ කාර්ය භාරය පැවරී ඇති වෙන යම් අධිකාරයක් හෝ යම් පළාත් පාලන ආයතනයක් හෝ වෙත සතු කරන ලද්දා වූ හෝ ඒ එකිනෙකෙහි පාලනය යටතේ ඇත්තා වූ ඉඩම් ද එයට ඇතුළත් වේ.

### උපලේඛනය

### අ ආකෘතිය

### අය් කිරීමේ දැන්වීම

රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබා ගැනීමේ) පනතේ කාර්ය සඳහා නිසි බලධරයකු වූ ———— (නම ද පදවි නාමයක් වේතොත් එය ද සඳහන් කරන්න) වන මම, ———— (නම සඳහන් කරන්න) වන ඔබ මෙහි වූ උපලේඛනයේ විස්තර කර ඇති රජයේ ඉඩමෙහි අනවසරයෙන් සන්තකය දරන බව*/පදිංචිව සිටින බව මගේ මතය හෙයින්, එම පනතේ 3 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර—

(අ) ඔබේ යැපෙන්නන් කිසිවකු වෙතොත් ඔවුන් ද සමග ඒ ඉඩම අත් හැර යන ලෙස; සහ

(ආ) ඒ ඉඩමේ නිරවුල් සන්තකය, (දිනය සඳහන් කරන්න) ———— වන දින හෝ එදිනට පෙර මේ පනතේ කාර්යය සඳහා නියම බලධරයකු වන මා * වෙතු හෝ (බලය දෙනු ලැබූ තැනැත්තාගේ නම සහ විස්තරයක් වෙතොත් එය ද සඳහන් කරන්න) ———— වෙත භාර දෙන ලෙස, (නම සඳහන් කරන්න)————වන ඔබට නියම කරමි.

————,

නියම බලධරයාගේ අත්සන, සහ පදවි නාමයක් වෙතොත් එය,

ඉහත සඳහන් කර ඇති උපලේඛනය:

(දිස්ත්‍රික්කයේ නම ද ඇතුළුව ඉඩමෙහි පිහිටීම මෙහි විස්තර කරන්න)

..................................................................

..................................................................

————,

නියම බලධරයාගේ අත්සන, සහ පදවි නාමයක් වෙතොත් එය,

දිනය :————.

* අදාළ නොවේ නම් අත් හරින්න.

ආ ආකෘතිය

**නෙරපීම සඳහා ඉල්ලීම**

———— මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ය.

(අධිකරණයේ නම සඳහන් කරන්න)

රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබා ගැනීමේ) පනතේ කාර්ය සඳහා නියම බලධරයකු වූ (නම ද පදවි නාමයක් වෙතොත් එය ද සඳහන් කරන්න) ———— වන මම, එම පනතේ 5 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බල තල ප්‍රකාර, මෙම ඉල්ලීමෙන්—

(අ) පහත සඳහන් කරුණු දක්වමි. එනම් :—

(i) මම ඒ නියම බලධරයා වෙමි ;

(ii) මෙම ඉල්ලීමේ උපලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම රජයේ ඉඩමකි ;

(iii) (මේ ඉල්ලීමට පිටපතක් අමුණා ඇති) අස්කිරීමේ දැන්වීමක් (නම සහ ලිපිනය සඳහන් කරන්න) ———— වෙත භාර දෙන ලදී.*/ එකී ඉඩමෙහි හෝ ඉඩම මත ප්‍රදර්ශනය කරන ලදී ;

(iv) එකී (නම සඳහන් කරන්න) ———— අනවසරයෙන් එකී ඉඩමෙහි සන්තකය දරන*/පදිංචිව සිටින අතර එම පනතේ 4 වන වගන්තියේ (ආ) ඡේදයේ විධිවිධාන අනුව ක්‍රියා කිරීම පැහැර හැර ඇත ;

(ආ) එකී ඉඩමේ සන්තකය ආපසු ලබා දෙන ලෙසත්, එකී (නම සඳහන් කරන්න) ———— සහ ඔහුගේ යැපෙන්නන් කිසිවකු වෙතොත් ඔවුන් ද එකී ඉඩමෙන් නෙරපන ලෙසත් අයැද සිටිමි.

————,
නියම බලධරයාගේ අත්සන, සහ පදවි නාමයක් වෙතොත් එය.

**ඉහත සඳහන් කර ඇති උපලේඛනය :**

(දිස්ත්‍රික්කය ද ඇතුළුව ඉඩමෙහි පිහිටීම මෙහි විස්තර කරන්න)

..........................................................................

..........................................................................

————,
නියම බලධරයාගේ අත්සන, සහ පදවි නාමයක් වෙතොත් එය,

දිනය ————.

*අදාළ නොවේ නම් අත් හරින්න.

ඇ ආකෘතිය

**දිවුරුම් පත්‍රය**

———— (නම ද පදවි නාමයක් වෙතොත් එය ද සඳහන් කරන්න) වන මම, රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබා ගැනීමේ) පනතේ 5 වන වගන්තියෙන් නියමිත පරිදි—

(i) ඒ පනතේ කාර්ය සඳහා මා නියම බලධරයකු බවත් ;

(ii) නෙරපීම සඳහා වූ ඉල්ලීමේ උපලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම රජයේ ඉඩමක් බවත් ;

(iii) (හෙරපීම සඳහා වූ ඉල්ලීමට පිටපතක් අමුණා ඇති) අස් කිරීමේ දැන්වීමක් (නම සහ ලිපිනය සඳහන් කරන්න) ——— වෙත භාර දෙන ලදී.*/ එකී ඉඩමෙහි හෝ ඉඩම මත ප්‍රදර්ශනය කරන ලදී;

(iv) එකී (නම සඳහන් කරන්න) ——— අනවසරයෙන් එකී ඉඩමෙහි සන්තකය දරන */පදිංචිව සිටින අතර එම පනතේ 4 වන වගන්තියේ (ආ) ඡේදයේ විධිවිධාන අනුව ක්‍රියා කිරීම පැහැර හැර ඇති බවත්

ගෞරව බහුමානයෙන් යුක්තව ද, අවංකව ද, සත්‍ය ලෙස ද මෙයින් ප්‍රකාශ කොට ප්‍රතිඥා දෙමි*/දිවුරා ප්‍රකාශ කරමි.

———,

සිද්ධි ප්‍රකාශකගේ අත්සන, සහ පදවි නාමයක් වේනොත් එය.

සිද්ධි ප්‍රකාශක විසින් 197——— ක්වූ මස ——— වන දින මෙදින මා ඉදිරිපිට දී ප්‍රතිඥා දෙන*/දිවුරන ලදී.

———,

ප්‍රතිඥා දීම කරවන හෝ දිවුරුම කරවන තැනැත්තාගේ අත්සන, සහ පදවි නාමයක් වේනොත් එය.

*අදාළ නොවේ නම් අත් හරින්න.